**IPRC/16/147**

# හින්දු තර්කයෙහි සහ යෝගාචාර විඥානවාදී න්‍යායෙහි එන ප්‍රත්‍යක්ෂය පිළිබඳ සංසන්දනාත්මක විමසීමක් (තර්කසංග්‍රහය හා න්‍යායබින්දුව ඇසුරින්)

මුවපැටිගෙවල පඤ්ඤාලෝක හිමි[1*]

ප්‍රත්‍යක්ෂය යනු ඉන්‍ද්‍රියාර්ථ සන්නිකර්ෂයෙන් හෙවත් ඉන්ද්‍රියයන්ට අරමුණු හමුවීමෙන් ඇති වන ඥානය බව (ඉන්‍ද්‍රියාර්ථ සන්නිකර්ෂ ජන්‍යං ඥානං ප්‍රත්‍යක්ෂම්) භාරතීය හින්දු තර්ක ශාස්ත්‍රයෙහි පිළිගැනීමයි. මහායාන, යෝගාචාර විඥානවාදී බෞද්ධ ගුරුකුලය නියෝජනය කරන න්‍යාය ශාස්ත්‍රය එය නිර්වචනය කරනුයේ කල්පනා හා ඉන්‍ද්‍රිය භ්‍රාන්ති යන දෙකෙන් වියුක්ත වූ ශුද්ධ සංවේදන මාත්‍රය ම ප්‍රත්‍යක්ෂය නම් වේ (තත්‍ර ප්‍රත්‍යක්ෂං කල්පනාප්‍රෝඪමභ්‍රාන්තම්) යනුවෙනි. තථ, අවිතථ, සත්‍ය, යථාභූතඥාන හා සම්‍යග් ඥාන යනාදී නම්වලින් හැඳින්වෙන නිවැරදි ඥානය ලබා ගැනීමේ මාර්ග පිළිබඳව යථෝක්ත සම්ප්‍රදායද්වයයේ පිළිගැනීම් එකිනෙකට වෙනස් ය. හින්දු තර්ක ශාස්ත්‍රය නියෝජනය කරන ග්‍රන්ථයක් වන තර්ක සංග්‍රහයේ ඥානෝපාය මාර්ග හතරක් (ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශාබ්ද) පිළිගන්නා අතර බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය නියෝජනය කරන න්‍යායබින්දුවෙහි පිළිගනු ලබනුයේ ප්‍රත්‍යක්ෂය හා අනුමානය යන ක්‍රම දෙක පමණකි. කෙසේ වුවත් ප්‍රත්‍යක්ෂය නමැති ඥානෝපාය මාර්ගය මෙම සම්ප්‍රදාය දෙකෙහි ම පිළිගැනේ. එහෙත් ප්‍රත්‍යක්ෂය විවරණය කිරීමේ දී තර්කසංග්‍රහයෙහි හෙවත් හින්දු තාර්කිකයන් නිර්විකල්ප ප්‍රත්‍යක්ෂය හා සවිකල්ප ප්‍රත්‍යක්ෂය යනුවෙන් ප්‍රත්‍යක්ෂයෙහි ප්‍රභේද දෙකක් දක්වන අතර නෛයායිකයෝ ප්‍රභේද හතරක් මගින් එය විවරණය කරති. තව ද ඉන්‍ද්‍රිය වෙත අරමුණ ගැටුණු පමණකින් එය ප්‍රත්‍යක්ෂයක් නොවන බව දක්වන න්‍යායබින්දුව ආශුභ්‍රමණය, නෞයානාදියෙහි ගමනය හා ආභ්‍යන්තරික ගුණ සංක්ෂෝභයක් සිදුවූ විට ලැබෙන ප්‍රත්‍යක්ෂය විකෘත වූවක් බව පෙන්වා දෙති. තව ද තාර්කිකයන්ගේ ප්‍රත්‍යක්ෂ ප්‍රභේද අතර එන සවිකල්පය ද න්‍යායවාදීහු සහේතුක ව බැහැර කරති. මෙසේ හින්දු සහ යෝගාචාර විඥානවාදී බෞද්ධ ගුරුකුලය විසින් යථාර්ථවත් දැනුම ලබා ගැනීමේ ක්‍රමවේදයක් වශයෙන් පිළිගනු ලබන ප්‍රත්‍යක්ෂය පිළිබඳ විග්‍රහයෙහි ආකෘතිකමය හා සන්දර්භීය විෂමතා පරීක්ෂා කොට ඒවායේ සාධනීය හා නිෂේධනීය ලක්ෂණ සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම අභිප්‍රාය යි. මෙම ප්‍රස්තුතය තර්ක න්‍යාය හා දර්ශන අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා පුළුල් ශාස්ත්‍රීය ගවේෂණයකට මඟ පාදනු ඇත.

***ප්‍රමුඛ පද:*** *තර්කසංග්‍රහ, න්‍යායබින්දු, ප්‍රත්‍යක්ෂ, යෝගාචාර විඥානවාදය, සම්‍යග්ඥානය*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *ven.muwapetigewela@gmail.com